
# 6.1 ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා



# ගම්පොළ රාජධානිය(ක්‍රි.ව.1341-1415)






ගම්පොළ රාජධානියේ දේශපාලන ඉතිහාසය පිළිබඳ ව සලකා බැලීමේදී අවධානය යොමු කළ යුතු කරුණු කීපයක් තිබේ.ඒවා නම්,

## ගම්පොළ යුගයට අදාළ රාජ වර්ෂ ගණන් බැලීම පිළිබඳව ඇති ගැටලුව.

මෙම යුගයට අයත් සිව්වන බුවනෙකබාහු V පරාක්‍රමබහු ,iii වික්‍රමබාහු හා v බුවනෙකබාහු යන රජවරුන් හැම දෙනා ම කලින් සිටි රජුට සමකාලීනව වසර කිහිපයක් ඈපා තත්ත්වය උසුලමින් පාලන කටයුතුවල යේ දී සිටීම. ඔවුන් තම සෙල්ලිපිවල රාජ වර්ෂ සදහන් කිරීමේ දී තමා එසේ පාලනය ඇරඹූ වර්ෂයේ සිට රාජ වර්ෂ ගණන් බලා ඇත. එසේ වුව ද සමකාලින නිකාය සංග්‍රහය කිසියම් රජෙකුගේ රාජ වර්ෂ ගණන් ගෙන ඇත්තේ මුලින් සිටි රජුගේ අවසාන අවුරුද්දේ සිට ය.

## ගම්පොළ රජ පවුල හා සම්බන්ධ වූ ප්‍රධාන ප්‍රභූ පවුල් දෙකක් පැවති බව.

IV බුවනෙකබාහු හා V පරාක්‍රමබාහු සොහොයුරන්ගේ කාලයේ ඔවුන් වෙනුවෙන් රටේ දේශපාලනය මෙහෙය වූ සේනාධිලංකාර සෙනවිරත් පවුල මින් පළමු වැන්නයි . සේනාධිලංකාර සෙනෙවි V වන පරාක්‍රමබාහුගේ සොහොයුරියක සමග විවාහ වී සිටි බවත් , ගම්පොළ තුන්වෙනි පාලකයා වූ වික්‍රමබාහු ඔවුන් දෙදෙනාගේ පුතු බවත් , සලකනු ලැබේ.ගම්පොළ රජ පවුලට සම්බන්ධ වූ දෙවන ප්‍රභූ පවුල වන්නේ අලකේශ්වර හෙවත් අලගක්කෝණාර පවුලයි.කළුතර දිස්ත්‍රක්කයේ රයිගම උපන් අලගක්කෝණාර පරපුරේ නිශ්ශංක අලගක්කෝණාර 1360 සිට ගම්පොළ රජ කළ III වික්‍රමබාහු වෙනුවෙන් පාලනය මෙහෙයවන ලද ප්‍රධාන සෙනෙවියා වේ.ප්‍රභූ රාජ නමින් හැඳින් වූ ඔහු වික්‍රමබාහු රජුගේ සහෝදරියක සමඟ විවාහ වී සිටි අතර III වික්‍රමබාහුගෙන් පසු රජ වූ V වන බුවනෙකබාහු එම සහෝදරියට අලකෙශ්වරගෙන් ලැබුණු පුතෙකු ලෙස සැලකේ.මෙම ප්‍රභූ රාජ අලගක්කෝණාර, අර්ථනායක හා දේවමන්ත්‍රී යන තිදෙනා බුවනෙකබාහු රජුගේ රාජ සභාවේ තනතුරු උසුලා ඇත.

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- දිනුෂා හර්ෂණී මිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගත පරීක්ෂාව :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය. සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## රාජ්‍ය උරුමය මාතෘ මූලික ව සිදුවීම.

ගම්පොළ යුගයේ දී රාජ්‍ය උරුම ක්‍රමය වූයේ මාතෘ මූලික ක්‍රමයයි .එනම් මාමාගෙන් බෑණාට හෙවත් සහෝදරියගේ පුත්‍රයාට රාජ්‍ය උරුම වීමයි.

උදාහරණ :- පස්වන පරාක්‍රමබාහු → සහෝදරිය ගේ පුතා වූ වික්‍රමබාහු → සහෝදරයාගේ පුතා වූ පරාක්‍රමබාහු පිළිවෙළින් රජ වීම.

විශේෂයෙන් අලගක්කෝණාර පවුලේ උරුම ක්‍රමය මෙලෙස මාතෘ මූලික උරුම ක්‍රමයකි.

- ගම්පොළ රාජධානි සමයේදී ආර්ය චක්‍රවර්ති නැමැත්තෙකු යටතේ යාපන අර්ධද්වීපය කේන්ද්‍ර කොටගෙන ප්‍රාදේශීය රාජ්‍යයක් දිවයිනේ උතුරු ප්‍රදේශයේ පැවති බව.

1360 පමණ වන විට උතුරේ ආර්ය චක්‍රවර්ති ගම්පොළ රාජධානියට බලපෑම් කළ හැකි තත්ත්වයක සිටියේ ය.මෙම යුගයේ දී ආර්ය චක්‍රවර්තිවරු දෙවරක් ගම්පොළ ආක්‍රමණය කළ බව මූලාශ්‍රයවල සඳහන් වේ.

1344 වර්ෂයේ මෙරටට පැමිණි මුස්ලිම් වන්දනා කරුවෙකු වන ඉබන් බතූතා උතුරේ ආර්ය චක්‍රවර්ති නම් පාලකයකු සිටි බව ද සඳහන් කර ඇත.ඉබන් බතූතා ශ්‍රී පාද වන්දනාව සඳහා යද්දී ආර්ය චක්‍රවර්තින්ගේ දේශ සීමාව පසු කළ පසු අල්කොනාර් නම් ප්‍රාදේශීය අධිපතියෙකු හමු වූ බවද සඳහන් කරයි.1344 දී විල්ගම්මුල මාහිමියන් කිත්සිරි මෙවන් කැලණි විහාරය පිළිසකර කිරීමේ දී අනුග්‍රහ දැක්වූ අලගක්කෝනාර පරපුරේ දහ වැන්නා වූ නිශ්ශංක අලගක්කෝනාර ඉබන් බතූතාට හමු වූ ඒ අලගක්කෝනාර බව නිසැක ය.ඔහු රයිගම වාසය කළ බව සඳහන් වේ.

මේ නිසා ගම්පොළ රාජධානී සමය ආරම්භයේ දී 1344 දී පමණ කුරුණෑගල සවුළු විජයබා ඔහුගේ පුත් V පරාක්‍රමබාහු ඈපාවරුන් ලෙස පාලනය කළහ.ඒ අතර කිත්සිරි මෙවන් කැලණියේ ප්‍රතිසංස්කරණය කටයුතුවලට විල්ගම්මුල මා හිමිටපානන්ට අනුග්‍රහය දැක්වූ අලගක්කෝනාර රයිගම ප්‍රදේශයේ ද ආර්ය චක්‍රවර්ති යාපන ප්‍රදේශයේ ද සිටියහ.






අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- දිනුෂා හර්ෂණි මිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගත පරීක්ෂාව :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය. සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

1347 සවුළු විජයබාහුගේ අභාවයෙන් පසු iv බුවනෙකබාහු ගම්පොළ රජ විය .මේ වන විට විල්ගම්මුල මාහිමියන් අවැමෙන් සංඝරාජ මා හිමි පදවියට දෙවනගල වනරතන මහා ස්ථිවිරයන් පත් ව සිටි අතර එතුමා iv බුවනෙකබාහු ආශ්‍රයේ ගම්පොළ වාසය කර ඇත.මෙකල iv බුවනෙකබාහු සේනාධිලංකාර සෙනවිරත් නමැති ප්‍රබල අගමැති කෙනෙකු සිටි අතර ඔහු දෙවනගල වනරතන හිමියන් ප්‍රමුඛ ග්‍රාමවාස වනවාස යන උභය විෂයේ ම භික්ෂූන් වහන්සේලා රැස් කරවා 1351 දී ශාසන සංශෝධනයක් ඇති කරන ලදී.1351 දී iv බුවනෙකබාහු ඇවැමෙන් දැදිගම සිටි v වන පරාක්‍රමබාහු ගම්පොළ රජ විය . මෙකල සේනාධිලංකාර සෙනවිරත් දකුණේ දෙවිනුවර වැලිගම යන ස්ථානවල ශාසන කටයුතු මෙහෙයවමින් v වන පරාක්‍රමබාහු රජුට දකුණේ ජන සහය ලබා දී තිබේ.v වන පරාක්‍රමබාහු රජුගේ සහෝදරියක හා සේනාධිලංකාර සෙනවිරත් අතර සිදු වූ විවාහයෙන් ලත් වික්‍රමබාහු නම් කුමාරයා 1357 දී ඇපා තනතුරු ලැබ v වන පරාක්‍රමබාහු රජුගේ පාලන කටයුතු සඳහා සහාය විය.








1359 දී ඇපා වශයෙන් සිටි III වික්‍රමබාහු v වන පරාක්‍රමබහු පලවා හැර 1360 දී ගම්පොළ රජ විය.මෙහි දී වික්‍රමබාහු රජුගේ පාක්ෂිකයන් උතුරේ ආර්ය චක්‍රවර්තීන්ගේ උදවු ලබා ගෙන ඇත.1360 දී ඇති වූ සම්මුතියකට අනුව III වික්‍රමබාහු විසින් උඩරට සිඳුරුවාන, බලවිට,මාතලේ ,දුම්බර, සගම තුන්රට යන ප්‍රදේශවල අයබදු අය කර ගැනීමේ අයිතිය මර්තාණ්ඩ පෙරුමාල් නැමැත්තෙකුට පවරා ඇත.මේ මර්තාණ්ඩ පෙරුමාල් නැමැත්තා උතුරේ ආර්ය චක්‍රවර්ති විය හැකිය. III වික්‍රමබාහු ඔහුට උඩරට ප්‍රදේශ ගණනකින් අයබදු අය කිරීමට ඉඩ දී තිබෙන්නේ v වන පරාක්‍රමබාහු පලවා හැරීම සඳහා ලබා ගත් උදවුවලට වන්දි වශයෙන් විය හැකි ය.

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- දිනුෂා හර්ෂණී මිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගත පරීක්ෂාව :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය. සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk



කෝට්ටේ නගර සැලැස්ම

III වික්‍රමබාහු රජුගේ අගමැතිවරයා වූයේ රයිගම ප්‍රදේශයේ පදිංචිව සිටි වෙළෙඳ පවුලකින් පැවත එන නිශ්ශංක අලගක්කෝණාර නම් ප්‍රභූවරයෙකි .ඔහු විවාහ වී සිටියේ වික්‍රමබාහු රජුගේ සහෝදරියක සමග ය.මේ වන විට උතුරේ ආර්ය චක්‍රවර්ති පාලකයන්ගේ බලය ඉතා වේගයෙන් දකුණට ව්‍යාප්ත වෙමින් පැවතුණි.1360 ගිවිසුමේ ප්‍රතිඵලක් වශයෙන් උඩරට ප්‍රදේශ ගණනවක මෙන් ම මීගමුව, හලාවත, වත්තල, කොළඹ යන බටහිර තොටුපළවල වෙළෙඳාම් කටයුතු ද ආර්ය චක්‍රවර්තිවරුන් අතට පත් වී තිබුණි. මෙම තොටුපළවල් ඇසුරෙන් කළ ආනයන -අපනයන වෙළෙඳාමෙන් ආර්ය චක්‍රවර්තිවරුන් විශාල ලාභයක් ලැබූ අතර ගම්පොළ රජුට එම ආදායම් නොලැබුණි.මේ තත්ත්වය දෙස ගම්පොළ  රජුගේ අගමැති වශයෙන් නිශ්ශංක අලගක්කෝණාරට තව දුරටත් බලා සිටිය නොහැකි වූ බැවින්  ඔහු ආර්ය චක්‍රවර්තිවරුන් බටහිර වෙරළේ තොටුපළවලින් පන්නා දැමීම සඳහා ක්‍රියාත්මක විය.මේ සඳහා ඉතාමත් සුදුසු ස්ථානය වූ කෝට්ටේ බලකොටුවක් ඉදි කළ ඔහු ඒ වටා ප්‍රාකාරයක් ද ඉදි කරන ලදී.මෙම බලකොටුව දියවන්නා ඔයෙන් තුන් පැත්තකින් වට වී තිබුණු අතර අනෙක් පැත්ත  මඩ ගොහොරුවලින් යුක්ත වූ බැවින් බෙහෙවින් ආරක්ෂාකාරී විය.

සැහෙන කාලෙකට ප්‍රමාණවත් තරම් ආහාර තොග කොටුව තුළ ගබඩා කළ අලගක්කෝනාර ඇමතිවරයා බටහිර වෙරළේ තොටුපළවල සිටි ආර්ය චක්‍රවර්තින්ගේ බදු එකතු කරන්නන් එලවා දැමිය.ඉන් කෝපයට පත් ආර්ය චක්‍රවර්ති පාලකයා නැවත එම තොටුපළවල් අල්ලා ගැනීම සඳහා බලසේනා එවූ නමුත් අලගක්කෝනාරගේ හමුදා විසින් ඔවුන් පලවා හරින ලදී. මෙම ක්‍රියාව නිසා ගම්පොළ රජුට විදේශ වෙළෙඳාමෙන් විශාල ආදායමක් උපයා දීමට අලගක්කෝනාර ඇමතිවරයාට හැකි විය.

අන්තර්ගතය   :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර  මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම    :- දිනුෂා හර්ෂණි මිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගත පරීක්ෂාව :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය. සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය නුගේගොඩ
Copyright © www.e-thaksalawa.moe.gov.lk

නිශ්ශංක අලගක්කෝනාර ගම්පොළ යුගයේ ප්‍රබල ඇමතිවරයෙක් වීමට බලපෑ සාධක.

- ප්‍රථම වතාවට කෝට්ටේ බලකොටුවක් ඉදිකිරීම.
- බටහිර වෙරළේ තොටුපළවල සිටි ආර්ය චක්‍රවර්තීවරුන් ගේ බදු එකතු කරන්නන් එලවා දැමීමට සමත් වීම.
- වර්ෂ 1369 පමණ වන විට වික්‍රමබාහු රජු වෙනුවෙන් දේශපාලනය මෙහෙය වූ ප්‍රධාන පුද්ගලයා වීම
- ශිලවංශ ධම්මකිත්ති හිමියන්ගේ ප්‍රධානත්වයෙන් මහා සංඝයා රැස් කරවා රාජ්‍ය බලය යොදවා දුසිල් මහණුන් සිවුරු අරවා ශාසන ශෝධනයක් කිරීම.
- කැලණි විහාරය ප්‍රතිසංස්කරණය කරමින් රයිගම ශාසනික කටයුතු පිළිබඳ සොයා බැලීම.

මෙවැනි සේවාවන් නිසා නිශ්ශංක අලගක්කෝනාර ඇමතිවරයා කෙතරම් බලසම්පන්න වී සිටියේද යත් ඇතැම් ලේඛනවල ඔහු හඳුන්වා ඇත්තේ රාජාලංකා මහීතලේ (ලංකාවේ රජු) යන නාමයෙනි.



කැලණි විහාරය.

III

වික්‍රමබාහු රජුගේ රාජ සභාවේ සිටි තවත් ප්‍රබල ප්‍රභූවරයෙකු වුයේ භාස්කර ජයමහලැන සිටුවාරයා ය.ඔවුන් දෙදෙනා ගම්පොළ රාජ සභවේ ඉරු- සඳු දෙබෑයන් සේ සිටි බව සඳහන් වේ.භාස්කර ජයමහලැන සිටාණන් නියම්ගම්පාය විහාරය ප්‍රතිසංස්කරණය කරන ලදි. නිශ්ශංක අලගක්කෝනාර ගේ පුත්‍රයා ක්‍රි.ව. 1372 දී වික්‍රමබාහු රජුගේ ඇපා ලෙස කටයුතු කරමින් සිට 1374 දී සිදු වූ රජුගේ අභාවයෙන් පසු V බුවනෙකබාහු නමින් ගම්පොළ රජ විය.



නියම්ගම්පාය විහාරය.

බුවනෙකබාහු රජුට ඇමතිකම් කළ අලකේශ්වර ,දේවමන්ත්‍රී සහ අර්ථනායක යන සහෝදරයන් තිදෙනා පිළිබද තලාතුඔය අසල පිහිටි සගම සෙල්ලිපියේ හා 1382 වර්ෂයේ ලිය වුණු එළු අගලු වංශයේ සඳහන් වේ. ඔවුන්ගෙන් වැඩිමල් සහෝදරයා වූ අලකේශ්වර V බුවනෙකබාහු රජුගේ අගමැති හෙවත් ප්‍රභූරාජ ලෙස කටයුතු කළේ ය .මෙම සහෝදරයන් තිදෙනා නිශ්ශංක අලගක්කෝනාරගේ සහෝදරියකගේ පුතුන්ය.V බුවනෙකබාහු පදවි ප්‍රාප්ත වී ටික කලකට පසු නිශ්ශංක අලගක්කෝනාර මිය ගියේ ය.නිශ්ශංක අලගක්කෝනාරගෙන් පසු කුමාර අලකේශ්වර් නැමැත්තෙක් රයිගම පාලනය ගෙන ගියේ ය.

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- දිනුෂා හර්ෂණි මිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගත පරීක්ෂාව :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය. සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය නුගේගොඩ
Copyright © www.e-thaksalawa.moe.gov.lk

සගම සෙල්ලිපියට අනුව අලකේශ්වර හා දේවමන්ත්‍රී යන දෙදෙනා සෙංකඩගල නාථ දෙවියන්ගේ සහ නා ගසේ වැඩහිටි දෙවියන්ගේ ආශිර්වාදයෙන් ලංකාව එක්සත් කළ බව සදහන් වේ.ඉන් ගම්‍ය වන්නේ මෙම සෙල්ලිපිය ලිය වුණු 1387 වර්ෂයට ආසන්න කාලයක දී සිදු වූ සටනකින් ඔවුන් ජයගෙන ඇති බව යි.නිශ්ශංක අලගක්කෝනාර විසින් බටහිර තොටුපළවල වෙළෙඳ බලය යළි ස්ථාපිත කර ගැනීම මෙම ආක්‍රමණයේ අරමුණ විය හැකි ය. මෙහි දී ආර්ය චක්‍රවර්තිවරු ගොඩින් හා මුහුදින් විශාල හමුදා සේනාංක දෙකක් එවා ගම්පොළ හා කෝට්ටෙ බලකොටුවට එකවර පහර දීමට සැලසුම් කර ඇත.ගොඩබිමින් ආ හමුදාව මාතලේ කඳවුරු බැඳගත් විට V බුවනෙකබාහු රජු ආරක්ෂාව පතා කෝට්ටෙ බලකොටුවට පලා ගියේය.උඩරට හමුදාව විසින් මාතලේ සිට ආර්ය චක්‍රවර්ති හමුදාව පරාජය කොට පලවා හරින ලදී.මුහුදින් ආ නැව් හමුදාව දෙමටගොඩ පානදුර ගොරකාන ආදී ස්ථානවල කඳවුරු ලා සිටි අතර අලකේශ්වරගේ හමුදා විසින් ඔවුන්ගේ නැව් විනාශ කොට ද්‍රවිඩ හමුදාවට පහර දී පන්නා දමන ලදී.මෙම ජයග්‍රහණයෙන් පසු අලකේශ්වර රයිගම නතර වූ අතර බුවනෙකබාහු රජ ගම්පොළ බලා පිටත් විය.සගම සෙල්ලිපියේ සඳහන් වන්නේ මෙම ජයග්‍රහණය පිළිබඳ විය හැකි ය.

→

ඉන්පසු බුවනෙකබාහු රජුගේ ඇපා තනතුර දැරුවේ අර්ථනායක ඇමතිවරයා බවත් අලකේශ්වර හා දේවමන්ත්‍රී යන දෙදෙනා රයිගම්පුර නවති සිටි බවත් මයූර සංදේශයෙන් හෙළි වේ.අර්ථනායක මිය යාමෙන් අනතුරුව ගම්පොළ රජුගේ ඇපා තනතුරට දේවමන්ත්‍රි පත්විය.ක්‍රි.ව. 1391 වර්ෂයේ දී V බුවනෙකබාහු රජ මිය ගිය පසු දේවමන්ත්‍රි ආදිපාදවරයා වීරබාහු නමින් ගම්පොළ රාජ්‍යත්වයට පත් වූ බව අස්ගිරි තල්පතෙහි සදහන් වේ.වීරබාහු රජු තමාගේ හයවෙනි රාජ වර්ෂයේ දී එනම් 1396 දී දේවරකිත ධම්මකිත්ති නා හිමියන්ගේ ප්‍රධානත්වයෙන් වනවාසි හා ග්‍රාමවාසී භික්ෂුන් රැස් කරවා සංඝ සම්මේලනයක් පවත්වා ශාසන ශෝධනයක් කළ බවත් ඒ අවස්ථාවේ දී රජුගේ පුත්‍රයා සසුන්ගත කරවූ බවත් නිකාය සංග්‍රහයේ සඳහන් වේ.

↓

වීරබාහු රජුගේ වැඩිමහල් සහෝදරයා අලකේශ්වර රයිගම පදිංචි වී එම ප්‍රදේශය පාලනය කළ අතර ඔහු වීරබාහු රජුගේ ආධිපත්‍යය පිළි නොගෙන ස්වාධින පාලකයෙකු ලෙස කටයුතු කළ බැවින් වීරබාහු රජු අලකේශ්වර අල්ලා ගැනිම සදහා ක්‍රි.ව. 1396 වර්ෂයේ අග දී පමණ හෝ 1397 වර්ෂයේ මුල දී රයිගමට ගිය බව අස්ගිරි තල්පතේ සදහන් වේ. සද්ධර්මරත්නාකරයට හා අස්ගිරි තල්පතට අනුව වීරබාහු හා අලකේශ්වර අතර සිදු වූ සටනින් අලකේශ්වර පරාජයට පත්වී දකුණු ඉන්දියාවට පලා ගොස් ඇත.පසුව වීරබාහු රජු දළදාව ඇතුළු වෙනත් වටිනා වස්තු ගම්පොළ සිට කෝට්ටෙ බලකොටුවට ගෙන්වා ගෙන එහි සිට රජකම් කළ බවත් ක්‍රි.ව. 1409 දී ඉන්දියාවට පැන ගිය අලකේශ්වර සේනාවක් සමග පැමිණ විරබාහු සමග සටන් කොට ඔහු මරා වීර අලකේශ්වර නමින් රයිගම බලයට පත් වූ බව අස්ගිරි තල්පතෙහි වැඩි දුරටත් සදහන් වේ.වීර අලකේශ්වර ආධිපත්‍ය පිළිගැනීමට අකැමැති වූ ගම්පොළ සේනාධිලංකාර පවුලේ කුමාරයෙක් ක්‍රි.ව. 1410 දී පරාක්‍රමබාහු නමින් සෙංකඩගල රජ කරවා ඇත. සද්ධර්මරත්නාකරයෙහි ඔහු හඳුන්වා ඇත්තේ පරාක්‍රම ඇපා යන නමිනි.මේ අනුව පරාක්‍රමබාහු ඔටුනු නොපලන් රජෙකු බව පැහැදිලි වේ.

→

මෙම අවධියේ චීනයේ යුංලෝ රජුගේ සෙන්පතියෙකු වූ චෙංහෝ ලංකාවට පැමිණ ඇත.අතිවිශාල නාවික හමුදාවක් සමග චෙංහෝ ගේ පැමිණීම පිළිබද චීන වාර්තාවල දක්වන්නේ මෙරට රජුට හා ජන ප්‍රධානින්ට තුටු පඬුරු හා පූජනීය ස්ථානවලට පිදීම සදහා පුද පඬුරු ද රැගෙන ඔහු පැමිණී බවයි.ඉන්දියන් සාගරබද කලාපයේ රටවලට තම බලය පෙන්වීමට චීන අධිරාජ්‍යයා විසින් චෙංහෝ ප්‍රමුඛ නැව් කණ්ඩායම් එවූ බව ඇතැම් ඉතිහාසඥයින්ගේ මතය යි.

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- දිනුෂා හර්ෂණී මිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගත පරීක්ෂාව :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය. සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

ක්‍රි.ව. 1405 දී ලංකාවේ දකුණු ප්‍රදේශයට ගොඩ බට චෙංහෝ පිළිගැනීම රයිගම වීර අලකේශ්වර ප්‍රතික්ෂේප කල බැවින් දකුණට යාත්‍රා කොට තමන් ගෙන ආ පුද පඬුරු දෙවිනුවර උපුල්වන් දේවාලයට පුද කොට ගාල්ලේ ත්‍රි භාෂා සෙල් ලිපියද පිහිටුවා ආපසු ගියේය.චීන,පර්සියන් හා දෙමළ භාෂා වලින් මෙම ලිපිය ලියා ඇත. තමන්ට දැක්වූ සතුරු ආකල්පය අනුව වීර අලකේශ්වර බෞද්ධ විරෝධී මිත්‍යා දෘෂ්ටිකයෙකු ලෙස චෙංහෝ විසින් සලකා ඇති බව ඉහත සෙල් ලිපියේ සඳහන් වේ.

ක්‍රි.ව. 1411 දී අතිවිශාල නාවික හමුදාවක් සමඟ චෙංහෝ යළිත් ලංකාවට පැමිණ ඇත.මෙහිදී ඔහු පිළිගැනීම ප්‍රතික්ෂේප කළ වීර අලකේශ්වර පනස් දහසක යුද බල ඇණියක් සූදානම් කොට චෙංහෝ ගේ ඉදිරි ගමන වැළක්වීම සඳහා ගස් කපා දමා පාරවල් අවහිර කොට ඔහුගේ නැව්වලට පහර දී විනාශ කිරීමට සැලසුම් කොට තිබේ.මේ බව ඔත්තුකරුවන් මගින් දැනගත් චෙංහෝ තුන්දහසක භට පිරිසක් ගෙන වෙනත් මාර්ගයකින් නගරයට ඇතුළු විය.

දෙපිරිස අතර දින හයක් තිස්සේ සිදු වූ බිහිසුණු සටනකින් පසුව අලකේශ්වර සහ ඔහුගේ නෑයන් සිරභාරයට ගත් චෙංහෝ දේශීය හමුදා සමඟ සටන් කරමින් ඔවුන් නැව්තොටුපළ වෙත ගෙන ආවේය.නගරයේ සිට නැව් තොටුපළට දුර ලි. 20 (සැතපුම් 5 ක්) පමණ බව චීන මූලාශ්‍රයවල සටහන් වේ. ඒ නිසා චෙංහෝ හා වීර අලකේශ්වර අතර සටන කෝට්ටේ නගරය හ එහි වූ බලකොටුව තුළ සිදු වූ බව සිතිය හැකි වේ. ඉන් හැඟී යන්නේ චෙංහෝගේ පැමිණීම සැලවූ විට වීර අලකේශ්වර ආරක්ෂාව සඳහා රයිගම සිට කෝට්ටේ බලකොටුවට වෙත පැමිණි ඇති බවයි.

මෙකල රයිගම හා උඩරට අතර පැවති බල අරගලය අනුව වීර අලකේශ්වර අල්ලා ගැනීම සඳහා ඔත්තු සපයන්නට ඇත්තේ උඩරට පාලනය කළ පරාක්‍රමබාහු රජුගේ ඔත්තු කරුවන් විය හැකිය.චෙංහෝගේ පැමිණීම පිළිබඳව උඩරට රජු දැනුවත්ව සිටි බව ද ඒ අනුව නිගමනය කළ හැකි ය.

ක්‍රි.ව. 1411 වර්ෂයේ දී වීර අලකේශ්වර ඇතුළු සිරකරුවන් පිරිස චීන රාජ සභාව ඉදිරියට පමුණුවන ලද බවත් චීන ඇමති මණ්ඩලය ඔවුන් සියලු දෙනා මරා දැමිය යුතු යැයි යෝජනා කළ බවත් චීන අධිරාජයා ඔවුන් මරණ දඬුවමින් නිදහස් කොට ලංකාවේ රජකමට සුදුස්සෙකු නම් කරන ලෙස ඔවුන්ට දැක්වූ බවත්, ඒ අනුව යෙහිපා නයිනා නැමැත්තා චීන රජුගේ නියෝජිතයා වශයෙන් ලංකාවේ රජු ලෙස පත් කොට සිරකරුවන් පිරිස නැවත ලංකාවට එවූ බවත් චීන මූලාශ්‍රය වල සඳහන් වේ.

ලංකාවේ පාලකයා ලෙස පත්කළ යෙහිපා නයිනා චීන භාෂාවට අනුව ඇපා වරයෙකු වන බැවින් ඔත්තු කරුවන් මගින් වීර අලකේශ්වර අල්ලා ගැනීමට තමාට උපකාර කළ සෙංකඩගල පරාක්‍රම ඇපා එම තනතුරට පත් කරන ලෙස චෙංහෝ සෙන්පතියා ද අධිරාජයාට උපදෙස් දෙන්නට ඇත.මේ අනුව චීන රජු විසින් ලංකාවේ පාලකයා ලෙස පත් කළේ සෙංකඩගල පරාක්‍රමබාහු ඇපා බව නිගමනය කළ හැකි ය.

සෙංකඩගල පරාක්‍රමබාහු රජුගේ අවැමෙන් ඔහුගේ පුත්‍රයා ක්‍රි.ව. 1411 දී පරාක්‍රමබාහු නමින් දැදිගම රජ විය.ඔහු දැදිගම පරාක්‍රමබාහු යන නමින් ප්‍රසිද්ධ විය.මොහු ගම්පොළ රජ පෙළපතේ අවසාන පාලකයා වේ.

Copyright © www.e-thaksalawa.moe.gov.lk



Copyright © www.e-thaksalawa.moe.gov.lk

## දැදිගම

දැදිගම ප්‍රාදේශිය පාලන මධ්‍යස්ථානයක් ලෙස මුලින් ම වැදගත් වන්නේ දොළොස්වන සියවසේ දී ය. පරාක්‍රම බාහුගේ පියා වූ මානාභරණ දක්ඛිණ දේශය පාලනය කරද්දී පාලන මධ්‍යස්ථානය ලෙස පැවති පුංඛගාමය දැදිගම ලෙස හඳුනා ගෙන ඇත.


V පරාක්‍රම බාහු දැදිගම බලයට පත්වී ක්‍රි.ව. 1351 දී ගම්පොළ රජවන තෙක් වසර 10ක් පමණ ස්වාධීන ප්‍රාදේශීය පාලන මධ්‍යස්ථානයක් වශයෙන් පැවති බව විශ්වාස කෙරේ. බුවනෙක බාහු රජුගේ මරණින් පසු V වන පරාක්‍රම බාහු රජු ගම්පොළට පැමිණ රාජ්‍ය විචාරණ කරන ලදී.

පෙර කාලවල දී රජ පවුල සමග කිසිඳු සබදතාවක් නොතිබූ දෙපිරිසක් මෙම අවධියේ දී ඉස්මතු වීම මෙකල දක්නට ලැබුණු විශේෂ ලක්ෂණයකි.එනම්,

### සේනාධිලංකාර සෙනවිරත් පවුල

මෙම පරපුරේ නායකයා සේනාධිලංකාර යි. වෙළෙඳ කටයුතු මගින් මොහු මහත් ධනයක් උපයාගෙන තිබුණි. V පරාක්‍රම බාහු හා IV බුවනෙක බාහු යන රජවරුන්ගේ කාලවල දී මන්ත්‍රීශ්වරායාණ කෙනෙකු ලෙස සහ සෙන්පති ලෙස කටයුතු කර ඇත.

සේනාධිලංකාර සෙනෙවි සිදු කළ වැදගත් කාර්යය ලෙස ලංකාතිලක විහාරය ඉදි කිරීම දැක්විය හැකි ය.ලංකාතිලක අලවල පර්වත ලිපියෙහි සේනාධිලංකාර විසින් ලංකාතිලක විහාරය කරවීම හා ප්‍රදානය පිළිබඳව තොරතුරු දැක්වේ.



කෝට්ටේ නගර සැලැස්ම

### අලගක්කෝනාර හෙවත් අලකේශ්වර පරපුර

රයිගම වණික් වංශයට හෙවත් වෙළෙඳ කුලයකට අයත් පිරිසකි. කිත්සිරි මෙවන් කැලණි සෙල් ලිපියට අනුව මෙම පෙළපතේ ආරම්භකයන් පැමිණ ඇත්තේ ඉන්දියාවේ කේරලයේ පිහිටි වැදගත් නගරයක් වූ වංචි පුරයේ සිට ය.1360 සිට වික්‍රමබාහු රජුගේ අගමැති වශයෙන් ද, ප්‍රභූරාජ වශයෙන් ද වැජඹෙමින් ජයවර්ධනපුර කෝට්ටෙ බලකොටුව ගොඩනැගුයේ මෙම පරපුරේ නිශ්ශංක අලගක්කෝනාර විසිනි.ඉබන් බතූතා විසින් ඔහු හඳුන්වන ලද්දේ සුල්තාන් හෙවත් රජු නමිනි.එමෙන් ම ඔහුට රාජ්‍ය බලයේ සංකේතයක් වූ සුදු අලියෙකු අයත්ව සිටි බව ද ඔහු විසින් දක්වා ඇත.




Copyright © www.e-thaksalawa.moe.gov.lk

ඉබන් බතුතාගේ ග්‍රන්ථයත් වෙනත් මූලාශ්‍රයත් පරිශීලනය කිරීමෙන් නිගමනය කළ හැක්කේ වර්ෂ 1344 වන විට අලගක්කෝනාර පරපුරේ ප්‍රභූවරයෙකු රයිගම කේන්ද්‍ර කොටගෙන විශාල බලයක් ගොඩ නගා ගෙන සිටි බව යි.එහෙත් ඔහු ගම්පොළ හෝ දැදිගම හෝ පාලකයන්ට විරුද්ධව කටයුතු නොකළ බව පෙනේ.

V පරාක්‍රමබාහු රජුගෙන් පසු ගම්පොළ රජ වූ තුන්වෙනි වික්‍රමබාහු ඉතා ම දුර්වල පාලකයෙකු විය.මේ අවධිය වන විට සේනාධිලංකාරගේ බලය දුර්වලව පැවති අතර වික්‍රමබාහුගේ අවසන් රාජ්‍ය කාලයේ දී අලගක්කෝනාර පරපුරේ නිශ්ශංක අලගක්කෝනාර රාජ සභාවේ අග්‍රමන්ත්‍රීවරයා බවට පත්විය.මොහු ප්‍රභුරාජ යන විරුධ නාමයෙන් නමින් හඳුන්වා ගනිමින් විශාල බලයක් ගොඩනගා ගෙන ඇත.නිශ්ශංක අලගක්කෝනාර විසින් වික්‍රමබාහු රජුගේ සොහොයුරියක වූ ජයසිරි කුමරිය විවාහ කර ගනිමින් රජ පවුල සමග ද සබඳතා ගොඩනගා ගෙන තම බලය තවත් ශක්තිමත් කරගෙන තිබේ.


Copyright © www.e-thaksalawa.moe.gov.lk
Copyright © www.e-thaksalawa.moe.gov.lk


# ගම්පොළ යුගයේ සංස්කෘතික කටයුතු


මෙම යුගයේ සංස්කෘතික කටයුතු
- භාෂාව හා සාහිත්‍යය
- ගෘහ නිර්මාණ හා කලා ශිල්ප.


## 1. භාෂාව හා සාහිත්‍යය


සිවුවන බුවනෙකබාහු රජුගෙන් ඇරඹි, කෝට්ටෙ යුගය ආරම්භය දක්වා වූ මෙම යුගය තුළ ධර්ම ශාස්ත්‍ර දියුණුව සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබිණි. ගම්පොළ ප්‍රධාන සංඝනායක සීලවංශ ධම්මරක්කිත මහා නා හිමියන් මෙකල ශාස්ත්‍රය පුනරුදහි මුලිකත්වය ගන්නා ලදී.මෙකල ලියවුණු කෘති ලෙස සිංහල භාෂාවෙන් රචිත ග්‍රන්ථ

ගම්පොළ යුගයේ සාහිත්‍ය කෘති.












අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- දිනුෂා හර්ෂණී මිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගත පරීක්ෂාව :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය. සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ගම්පොළ යුගයේ සාහිත්‍ය කෘති




### ගම්පොළ යුගයේ ලියවුණු පාලි ග්‍රන්ථ

- ජිනබෝධාවලි -
  ජයබාහු දේවරක්ඛිත හිමි
- පාරමී මහා ශතකය හා ජනානුරාග චරිත-
  ශීලවංශ ධම්මරක්කිත හිමි
- වුත්තමාලා සංදේශ ශතකය -
  ගතාරා උපතපස්සි හිමි
- විමුක්ති සංග්‍රහය -
  විල්ගම්මුල හිමි

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- දිනුෂා හර්ෂණි මිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගත පරීක්ෂාව :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය. සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

# ගෘහ නිර්මාණ හා කලා ශිල්ප

දකුණු ඉන්දියානු කලාකරුවන් මෙරටට පැමිණීම හා ඔවුන් මෙරට කලා කටයුතු වල නිරත වීම මෙකල දක්නට ලැබේ.
උදා :- ධම්මකිත්ති හිමියන් සමග පැමිණි ගනේශ්වරාචාර්ය ඇතුළු කලාකරුවන් පිරිස ගඩලාදෙණිය ,ලංකාතිලකය විජයොත්පාය ,නියම්ගම්පාය ආදී වෙහෙර විහාර ඉදි කිරීම.
විහාරවල හා දේවාලවල දැව හා ශෛලමය කැටයම් මෙකල ජනප්‍රිය විය.ඇම්බෙක්කේ කැටයම් මේ යුගයට අයත් වේ.



ඇම්බැක්කේ දේවාලය



ඇම්බැක්කේ කැටයම්

ඇම්බැක්කේ දේවාලයේ ලි කණුවල ඇති පනේල විවිධාකර වූ කැටයම්වලින් අලංකාර කර ඇත .නයි පුට්ටුව , හංස පුට්ටුව, වෘෂභ කුංජරය, ගජසිංහ රූපය,භේරුණ්ඩ පක්ෂියා ,මල්ලව පොරය,ඇත් පොරය, ඇත්කඳ ලිහිණියා ,සාර පෙණ්ඩියා,රබන් වයන ළඳ ,නළගන රූපය ,කිඳුරු රූප, අශ්වාහරෝක සෙබළා ආදිය ඒ සඳහා නිදසුන් කිහිපයකි.ඇම්බක්කේ දේවාලයේ ගෘහ නිර්මාණ ශිල්පය ද පැරණි ගෘහ නිර්මාණ ශිල්පය අනුව යමින් ඉදිකර ඇත.මෙහි ලී කණු සමූහය මත ඉදිකර ඇති වහලය හැඩ කපන ලද පරාල සමූහයකින් යුක්ත වන අතර මේ පරාල සියල්ල ම කැණිමඩල නම් වූ ලී රාමුවකට සවි කර ඇත.

ගම්පොළ අසල පිහිටි අළුදෙණිය විහාරයේ අලුත් දේවාලය නමැති ගොඩනැගිල්ලට සවි කර ඇති ලී උළුවස්ස කැටයම්වලින් අනූන උසස් නිර්මාණයකි .



කැණිමඩල

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- දිනුෂා හර්ෂණි මිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගත පරීක්ෂාව :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය. සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk


## දඹදෙණි රාජවංශය

- විජයමල්ල
  - III විජයබාහු
    - II පරාක්‍රමබාහු
      - IV විජයබාහු
        - III පරාක්‍රමබාහු
      - I බුවනෙකබාහු
        - II බුවනෙකබාහු
          - IV පරාක්‍රමබාහු
      - ත්‍රිලෝකමල්ල
      - පරාක්‍රමබාහු
      - ජයබාහු
    - බුවනෙකබාහු ආධිපාද
    - කුමරිය
      - වීරබාහු

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- දිනුෂා හර්ෂණී මිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගත පරීක්ෂාව :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය. සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk




Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- දිනුෂා හර්ෂණී මිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගත පරීක්ෂාව :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය. සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ආශ්‍රිත ග්‍රන්ථ

- ගුරු මාර්ගෝපදේශනය-2018 (12 වසර )
- ශ්‍රී ලංකාවේ ඉතිහාසය II කොටස - අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- අ.පො.ස. උසස් පෙළ ලංකා ඉතිහාසය (12 ශ්‍රේණිය )- ටිකිරි බණ්ඩාර ඒකනායක
- ලංකා විශ්ව විද්‍යාලය ලංකා ඉතිහාසය

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- කේ . කේ . එස් .ඒ . කන්නන්ගර මිය . ගුරු උපදේශක - ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය.
සැකසුම :- දිනූෂා හර්ෂණී මිය, ජාතික තරුණ සේවා සභාව (2017-2018)
අන්තර්ගත පරීක්ෂාව :- ශශිකා හෙට්ටිආරච්චි මෙනවිය. සමුද්‍ර දේවි බාලිකා විද්‍යාලය නුගේගොඩ

Copyright © www.e-thaksalawa.moe.gov.lk